අයවැය චක්‍රලේඛ අංක : 130(III)

2009 දෙසැම්බර් 08

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>දේපළ ණය බැංකු මගින් ලබාදීම - ගිණුම් තැබීමේ උපදෙස්</u>**

2009.11.18 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 (1) දරන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ. ඒ අනුව, දේපල ණය, බැංකු මගින් ලබාදීම සඳහා දැනට මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2006.06.28 දිනැති අයවැය චක්‍රලේඛ අංක 130, 2007.02.14 දිනැති අයවැය චක්‍රලේඛ අංක 130(I) හා 2007.06.29 දිනැති අයවැය චක්‍රලේඛ අංක 130(II) චක්‍රලේඛවල සඳහන් ගිණුම් උපදෙස් වලට අමතරව පහත සඳහන් ගිණුම් උපදෙස් 2009.11.01 දින සිට අනුගමනය කළයුතු බව මෙයින් දන්වා සිටිමි.

1. රජයේ සේවකයින්ගෙන් අයකරනු ලබන පොලිය

(අ) 2007.06.15 දිනට පෙර රජයේ සේවකයින්ට බැංකුවෙන් නිදහස් කළ සම්පූර්ණ ණය මුදල හෝ ණය මුදලෙන් නිදහස් කළ කොටස සඳහා එම ණය මුදල ගෙවා අවසන් වනතුරු සේවකයාගෙන් අයකළ යුතු පොලිය, 2005 මාර්තු 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 8/2005 හා ඊට සිදුකර ඇති සංශෝධනයන්ට සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006.06.28 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 130 ට අනුකූලව විය යුතු ය.

(ආ) 2007.06.15 දිනට පෙර අනුමත ණය මුදලෙන් කොටසක් ලබාගෙන එම ණය මුදලේ ඉතිරි කොටස 2007.06.15 සහ 2009.10.31 අතරතුර කාලයේදී බැංකුවෙන් ලබාගෙන ඇත්නම් නම් එම ණය කොටස සඳහා සේවකයාගෙන් අය කළයුතු ණය පොලිය 2007.06.12 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 හි 1.2.2 වන වගන්තියට හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2007.06.29 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 130(II) 1 ජේදයට අනුකූලව විය යුතු ය.

(ඇ) 2009.11.01 දින සිට ඉදිරියට රජයේ සේවකයින්ට බැංකුවෙන් නිදහස් කළ සම්පූර්ණ ණය මුදල හෝ ණය මුදලෙන් නිදහස් කළ කොටස සඳහා එම ණය මුදල ගෙවා අවසන් වනතුරු සේවකයාගෙන් අයකළ යුතු පොලිය, 2009 නොවැම්බර් 18 දිනැති රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 (1) හි 1.2 යටතේ දැක්වෙන ණය පොලිය තීරණය කිරීම යන ජේදයට හා මෙම චක්‍රලේඛයෙහි උපදෙස් වලට අනුකූලව විය යුතු ය.

2. ඉහත චක්‍රලේඛය යටතේ රජයේ සේවකයින් සඳහා දේපල ණය, බැංකු මගින් ලබාදීමේ ක්‍රමවේදය ආරම්භයේ සිට මේ දක්වා ලබාගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන සියළුම ණය මුදල් හෝ ණය මුදල්වල කොටස් සඳහා ඔහු/ඇය විසින් ගෙවිය යුතු පොලිය තීරණය කිරීම හා රජය විසින් ගෙවිය යුතු පොලී සහනාධාරය තීරණය කිරීමේදී ඒ සියලු ණය කොටස්, එකම ණය මුදලක් සේ සලකා කටයුතු කරනු ඇත. මේ අනුව රජයේ සේවකයෙකු විසින් බැංකු මගින් ලබාගත් හා ඉදිරියේදී ගනු ලබන දේපල ණය සඳහා පොලී ගණනය කළයුතු ආකාරය පිළිබඳ උදාහරණ කිහිපයක් මෙම චක්‍රලේඛයේ උපලේඛන අංක I මගින් දක්වා ඇත.

3. බැංකු සඳහා ගෙවිය යුතු පොලිය

2009.11.18 දිනැති, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 (1) හි 1.2 ජේදය හා 02(II) ජේදය අනුව :

(අ) 2007.06.15 දිනට පෙර බැංකුව විසින් දේපල ණය වෙනුවෙන් නිදහස් කර ඇති ණය මුදල් වලට අදාල බැංකුවලට ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය වන 11% තවදුරටත් නොවෙනස්ව පවතිනු ඇත.

(ආ) 2007.06.15 වන සිට 2009.10.31 දින දක්වා බැංකුව විසින් දේපල ණය වෙනුවෙන් නිදහස් කල ණය මුදල්වලට අදාලව බැංකුවලට ගෙවිය යුතු පොලී අනුපාතය 14.5% ලෙස පවතිනු ඇත.

(ඇ) රජයේ සේවකයකු ;

(i) 2007.06.15 වන දිනට පෙර

(ii) 2007.06.15 සිට 2009.10.31 දක්වා

(iii) 2009.11.01 දින සිට ඉදිරියට වශයෙන්

සම්පූර්ණ ණය මුදල කොටස් වශයෙන් බැංකුවෙන් නිදහස් කරගත්තේ නම් / ඉදිරියට නිදහස් කරගනු ලබන්නේ නම්, එම එකිනෙක කාලපරිච්ජේදවලට අදාලව බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතිකයන් එකිනෙකට වෙනස් වන බැවින් (පිළිවෙලින් 11%, 14.5%, 12% හෝ 14%) ඒ ඒ කාලපරිච්ජේදයට අනුකූලව එකම ණය මුදලක් හෝ ණය මුදල් කිහිපයක් සේ සලකා බැංකුව විසින් අයකරනු ලබන ණය වාරිකයන් පිළිබඳ විස්තර වෙන වෙනම ලබාගත යුතුය. එසේම එම ණය වාරික පියවීමේදී බැංකුව දෙනු ලබන උපදෙස් අනුව පියවීම් කල යුතු වන අතර මෙම චක්‍රලේඛයේ උපලේඛන I ට අනුකූලව පොලී ගණනය කිරීම සිදුකළ යුතුය.

4. ණය ලබාගත් කාලය අනුව හා උක්ත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව, නිලධාරියාගෙන් අයකරනු ලබන පොලිය, රජය විසින් ගෙවනු ලබන පොලී සහනාධාරය සහ බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාත පහත වගුවෙන් සාරාංශ කොට දක්වා ඇත.

| ණය නිදහස් කළ දිනය | ණය පරාසය | ණය පොලී අනුපාතය | | බැංකුව වෙත ගෙවිය යුතු පොලී අනුපාතය |
|---|---|---|---|---|
| | | සේවකයා | රජය | |
| 2007.06.15 ට පෙර | සියළුම ණය ප්‍රමාණයන් සඳහා | 4% | 7% | 11% |
| 2007.06.15 සිට 2009.10.31 දක්වා | (1) රු.500,000/- දක්වා<br>(2) රු.500,001/- සිට රු.1,000,000/- දක්වා<br>(3) රු.1,000,001/- සිට රු.3,000,000 දක්වා | 4%<br>8%<br><br>11% | 10.5%<br>6.5%<br><br>3.5% | 14.5%<br>14.5%<br><br>14.5% |
| 2009.11.01 සිට | (1) රු.500,000/- දක්වා<br>(2) රු.500,001/- සිට රු.1,000,000 දක්වා<br>(3) රු.1,000,001/- සිට රු.3,000,000/- දක්වා | 4%<br>8%<br><br>11% | 8%<br>4%<br><br>3% | 12%<br>12%<br><br>14% |

5. මේ දක්වා නිදහස් කර ඇති සහ ඉදිරියේදී නිදහස් කරනු ලබන ණය වෙනුවෙන් අදාල වාරිකය හා එයට අදාල පොලී පිළිබඳ විස්තර ලබාගැනීම හා ගිණුම් තැබීම :

(අ) සේවකයා විසින් ගෙවිය යුතු පොලිය හා රජය විසින් දැරිය යුතු පොලී සහනාධාරය ගණනය කිරීම සඳහා බැංකුව විසින් ණය නිදහස් කළ වහාම සහ ඉන් අනතුරුව සෑම වසරකම ජනවාරි මාසයට පෙර අදාල වර්ෂය සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛණ II අනුව තොරතුරු ලබාගත යුතුය.

(ආ) ඉහත 5 (අ) ට අදාල ගණනය කිරීම සඳහා ;

(i) 2005.04.01 දින සිට 2007.06.14 දින දක්වා නිදහස් කළ ණය සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛණ II(a)

(ii) 2007.06.15 දින සිට 2009.10.31 දින දක්වා නිදහස් කළ ණය සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛණ II (b)

(iii) 2009.11.01 දින සිට ඉදිරියට නිදහස් කරන ලද ණය සඳහා මෙම චක්‍රලේඛයේ උපලේඛණ II(c) භාවිතා කළ යුතුය.

(iv) යම් දේපල ණයලාභියෙකුගේ සමස්ත ණය, ඉහත දක්වන ලද කාලපරිච්ඡේද එකකට වඩා වැඩි සංඛ්‍යාවකට අයත් වන්නේ නම් මෙම චක්‍රලේඛයේ උපලේඛණ II(d) මගින් ඉහත තොරතුරු සාරාංශගත කොට දැක්විය යුතුය.

(ඇ) මෙම චක්‍රලේඛයේ උපලේඛණ අංක II ට අනුකූලව බැංකුවෙන් ලබාගත් තොරතුරු මත 2007.06.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/2007 හි 1.2.2 හා 1.3 වගන්තිවලට අනුව හා මෙම චක්‍රලේඛයේ 1 ජේදයේ (අ),(ආ) හා (ඇ) වගන්ති වලට අනුකූලව රජය විසින් ගෙවිය යුතු පොලී සහනාධාරය, සේවකයාගෙන් අය කළයුතු පොලිය හා බැංකුව වෙත ප්‍රේෂණය කළයුතු වාරිකයේ නිරවද්‍යතාවය තහවුරු කරගැනීම හා අදාල බැංකු ශාඛාව වෙත ඊළඟ මාසයේ 05 වන දිනට පෙර ප්‍රේෂණය කිරීම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විෂය භාර නිලධාරීන්ගේ වගකීම වේ.

උපලේඛන අංක : I

| උදාහරණ | බැංකුව අනුමත කල මුළු ණය මුදල<br>රු. | 2007.06.15 ට පෙර නිදහස් කල ණය මුදල<br>රු. | 2007.06.15 හා 2009.10.31 අතර කාලය තුල නිදහස් කල ණය මුදල<br>රු. | 2009.11.01 ට පසු නිදහස් කල ණය මුදල<br>රු. | ණය පොලී ගණනය කරනු ලබන ණය පරාසයන්<br>රු. | 2007.06.15 ට පෙර ලබාගත් ණය සඳහා අයකරන පොලී ප්‍රතිශතය | | 2007.06.15 හා 2009.10.31අතර කාලයේදී ලබාගත් ණය සඳහා අය කරන පොලී ප්‍රතිශතය | | 2009.11.01 සිට අයකරන පොලී ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සේවක | රජය | සේවක | රජය | සේවක | රජය |
| 1 | 1,350,000 | 350,000 | 1,000,000 | | (1) 2007/6/15 ට පෙර නිදහස් කල 350,000 සඳහා | 4% | 7% | | | | |
| | | | | | (2) පළමු 500,000 න් ඉතිරි 150,000/- සඳහා | | | 4% | 10.5% | | |
| | | | | | (3) දෙවන 500,000/- සඳහා | | | 8% | 6.5% | | |
| | | | | | (4) ඉතිරි 350,000/- සඳහා | | | 11% | 3.5% | | |
| 2 | 1,400,000 | 650,000 | 750,000 | | (1) 2007/6/15 ට පෙර නිදහස් කල 650,000 සඳහා | 4% | 7% | | | | |
| | | | | | (2) 650,000 සිට 1,000,000 දක්වා වන 350,000 සඳහා | | | 8% | 6.5% | | |
| | | | | | (3) ඉතිරි 400,000/- සඳහා | | | 11% | 3.5% | | |
| 3 | 900,000 | 300,000 | 300,000 | 300,000 | (1) 2007/6/15 ට පෙර නිදහස් කල 300,000/- සඳහා | 4% | 7% | | | | |
| | | | | | (2) දෙවන 300,000/- න් 200,000/- ක් සඳහා | | | 4% | 10.5% | | |
| | | | | | (3) ඉතිරි 100,000/- සඳහා | | | 8% | 6.5% | | |
| | | | | | (4) අවසාන 300,000/- සඳහා | | | | | 8% | 4% |
| 4 | 1,200,000 | | 500,000 | 700,000 | (1) පළමු 500,000/- දක්වා | | | 4% | 10.5% | | |
| | | | | | (2) දෙවන 500,000/- සිට 1,000,000/- දක්වා | | | | | 8% | 4% |
| | | | | | (3) 1,000,001/- ට වැඩි ඉතිරි 200,000/- සඳහා | | | | | 11% | 3% |
| 5 | 1,200,000 | 500,000 | 500,000 | 200,000 | (1) 2007/6/15 ට පෙර නිදහස් කළු 500,000/- සඳහා | 4% | 7% | | | | |
| | | | | | (2) දෙවන 500,000/- සිට 1,000,000/- දක්වා | | | 8% | 6.5% | | |
| | | | | | (3) 1,000,001/- ට වැඩි ඉතිරි 200,000/- සඳහා | | | | | 11% | 3% |

**ණය වාරික හා පොලී අයකිරීම පිළිබඳ මාසික විස්තර ලබාදීම** **උපලේඛන අංක: II (a)**

(2005.04.01 සිට 2007.06.14 දක්වා නිදහස් කළ ණය මුදල් වලට අදාළ වේ)

.. (ලිපිනය)

1. නිලධාරියාගේ නම : ..
2. තනතුර : .
3. හැඳුනුම්පත් අංකය : ..
4. සේවා ස්ථානයේ ලිපිනය :

05. ණය හිමිකම් අංකය : ..
06. ප්‍රදානය කළ ණය මුදල : රු.
07. ණය මුදල නිදහස් කළ දිනය : ..

(රුපියල්)

| වර්ෂය<br><br>A | මාසය<br><br>B | ණය මුදලෙන් අයකරනු ලබන වාරිකය<br><br>C | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය<br>4%<br>D | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය සමඟ මුළු වාරිකය<br>(C+ D)<br>E | රජය විසින් ගෙවිය යුතු පොලිය<br>7%<br>F | බැංකුව වෙත ගෙවිය යුතු මුළු පොලිය<br>(D+F)<br>G | බැංකුව වෙත ගෙවිය යුතු මුළු ණය වාරිකය<br>(C+G)<br>H |
|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | | | | | | |
| | පෙබරවාරි | | | | | | |
| | මාර්තු | | | | | | |
| | අප්‍රේල් | | | | | | |
| | මැයි | | | | | | |
| | ජූනි | | | | | | |
| | ජූලි | | | | | | |
| | අගෝස්තු | | | | | | |
| | සැප්තැම්බර් | | | | | | |
| | ඔක්තෝම්බර් | | | | | | |
| | නොවැම්බර් | | | | | | |
| | දෙසැම්බර් | | | | | | |

**ණය වාරික හා පොලී අයකිරීම පිළිබඳ මාසික විස්තර ලබාදීම** **උපලේඛන අංක: II (b)**

(2007.06.15 සිට 2009.10.31 දක්වා නිදහස් කළ ණය මුදල්වලට අදාළ වේ)

.. (ලිපිනය)

1. නිලධාරියාගේ නම : ..
2. තනතුර : .
3. හැඳුනුම්පත් අංකය : ..
4. සේවා ස්ථානයේ ලිපිනය :

05. ණය හිමිකම් අංකය : ..
06. ප්‍රදානය කළ ණය මුදල : රු.
07. ණය මුදල නිදහස් කළ දිනය: .

(රුපියල්)

| වර්ෂය | මාසය | ණය මුදලෙන් අයකරනු ලබන වාරිකය | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය D | | | සේවකයාගෙන් අයකරනු ලබන මුළු පොලිය E | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය සමඟ මුළු වාරිකය F | රජය විසින් ගෙවිය යුතු පොලිය G | | | රජය විසින් ගෙවිය යුතු මුළු පොලිය H | බැංකුව වෙත ගෙවිය යුතු මුළු පොලිය I | බැංකුව වෙත ගෙවිය යුතු මුළු ණය වාරිකය J |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| A | B | C | 4% $D_1$ | 8% $D_2$ | 11% $D_3$ | ($D_1 + D_2 + D_3$) | (C+ E) | 10.5% $G_1$ | 6.5% $G_2$ | 3.5% $G_3$ | ($G_1 + G_2 + G_3$) | (E+H) | (C+I) |
| | ජනවාරි | | | | | | | | | | | | |
| | පෙබරවාරි | | | | | | | | | | | | |
| | මාර්තු | | | | | | | | | | | | |
| | අප්‍රේල් | | | | | | | | | | | | |
| | මැයි | | | | | | | | | | | | |
| | ජූනි | | | | | | | | | | | | |
| | ජූලි | | | | | | | | | | | | |
| | අගෝස්තු | | | | | | | | | | | | |
| | සැප්තැම්බර් | | | | | | | | | | | | |
| | ඔක්තෝම්බර් | | | | | | | | | | | | |
| | නොවැම්බර් | | | | | | | | | | | | |
| | දෙසැම්බර් | | | | | | | | | | | | |

**ණය වාරික හා පොලී අයකිරීම පිළිබඳ මාසික විස්තර ලබාදීම** **උපලේඛන අංක: II (c)**

(2009.11.01 සිට නිදහස් කළ ණය මුදල්වලට අදාළ වේ )

.. (ලිපිනය)

1. නිලධාරියාගේ නම : ..
2. තනතුර : .
3. හැඳුනුම්පත් අංකය : ..
4. සේවා ස්ථානයේ ලිපිනය :

05. ණය හිමිකම් අංකය : ..
06. ප්‍රදානය කළ ණය මුදල : රු.
07. ණය මුදල නිදහස් කළ දිනය: .

(රුපියල්)

| වර්ෂය | මාසය | ණය මුදලෙන් අයකරනු ලබන වාරිකය | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය D | | | සේවකයාගෙන් අයකරනු ලබන මුළු පොලිය E | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය සමඟ මුළු වාරිකය F | රජය විසින් ගෙවිය යුතු පොලිය G | | | රජය විසින් ගෙවිය යුතු මුළු පොලිය H | බැංකුව වෙත ගෙවිය යුතු මුළු පොලිය I | බැංකුව වෙත ගෙවිය යුතු මුළු ණය වාරිකය J |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| A | B | C | 4% $D_1$ | 8% $D_2$ | 11% $D_3$ | $(D_1 + D_2 + D_3)$ | (C+ E) | 8% $G_1$ | 4% $G_2$ | 3% $G_3$ | $(G_1 + G_2 + G_3)$ | (E+H) | (C+I) |
| | ජනවාරි | | | | | | | | | | | | |
| | පෙබරවාරි | | | | | | | | | | | | |
| | මාර්තු | | | | | | | | | | | | |
| | අප්‍රේල් | | | | | | | | | | | | |
| | මැයි | | | | | | | | | | | | |
| | ජූනි | | | | | | | | | | | | |
| | ජූලි | | | | | | | | | | | | |
| | අගෝස්තු | | | | | | | | | | | | |
| | සැප්තැම්බර් | | | | | | | | | | | | |
| | ඔක්තෝම්බර් | | | | | | | | | | | | |
| | නොවැම්බර් | | | | | | | | | | | | |
| | දෙසැම්බර් | | | | | | | | | | | | |

**ණය වාරික හා පොලී අයකිරීම පිළිබඳ මාසික විස්තර ලබාදීම** **උපලේඛන අංක: II (d)**

(ඉහත උපලේඛණ II a, b හා c හි සාරාංශය)

.. (ලිපිනය)

1. නිලධාරියාගේ නම : ..
2. තනතුර : .
3. හැඳුනුම්පත් අංකය : ..
4. සේවා ස්ථානයේ ලිපිනය :

05. ණය හිමිකම් අංක/අංකය :
06. ප්‍රදානය කළ මුළු ණය මුදල* : රු.
*(අදාළ පරිදි උපලේඛණ II a, b හා c හි එකතුව)
07. ණය මුදල් නිදහස් කළ දිනයන් : .

(රුපියල්)

| වර්ෂය<br>A | මාසය<br>B | ණය මුදලෙන් අයකරනු ලබන වාරිකය<br>C | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය (අදාළ පරිදි උපලේඛණ II a, b හා c හි එකතුව)<br>D | සේවකයාගෙන් අයකරනු ලබන පොලිය සමඟ මුළු වාරිකය<br>E<br>(C+ D) | රජය විසින් ගෙවිය යුතු මුළු පොලිය (අදාළ පරිදි උපලේඛණ II a, b හා c හි එකතුව)<br>F | බැංකුව වෙත ගෙවිය යුතු මුළු පොලිය<br>G<br>(D+F) | බැංකුව වෙත ගෙවිය යුතු මුළු ණය වාරිකය<br>H<br>(C+G) |
|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | | | | | | |
| | පෙබරවාරි | | | | | | |
| | මාර්තු | | | | | | |
| | අප්‍රේල් | | | | | | |
| | මැයි | | | | | | |
| | ජූනි | | | | | | |
| | ජූලි | | | | | | |
| | අගෝස්තු | | | | | | |
| | සැප්තැම්බර් | | | | | | |
| | ඔක්තෝම්බර් | | | | | | |
| | නොවැම්බර් | | | | | | |
| | දෙසැම්බර් | | | | | | |